# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


මගේ අංකය / எனது இல. / My No. CSS/7/1/4/1-1 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2014.07.09

දකුණු පළාතේ,

අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානින් හා

ආයතන ප්‍රධානින් වෙත.

<u>සති අන්ත හා රජයේ නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් දින වැටුප් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>

මාණ්ඩලික නිලධාරින් විසින් දින වැටුප් ගෙවීමේ පදනම මත, සති අන්ත හා රජයේ නිවාඩු දිනයන්හි සේවයේ නිරත වීම වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීමට අදාළ අයදුම්පත් ප්‍රධාන ලේකම් කාර්යාලයට ප්‍රමාද වී ඉදිරිපත් කරන අවස්ථා වාර්තා වී ඇත.

02. එබැවින් මින් ඉදිරියට දින වැටුප් පදනම මත සති අන්ත හා රජයේ නිවාඩු දිනවල සේවය කිරීමට ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත අනුමැතියට ඉදිරිපත් කරන සියලුම අයදුම්පත් රාජකාරියේ යෙදීමට නියමිත දිනට පෙරාතුව ඉදිරිපත් කර පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව කාරුණිකව දන්වමි.

03. එසේම පූර්ව අනුමැතිය සඳහා ඉදිරිපත් නොකරන හා ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් හඳුන්වා දී ඇති නියමිත ආකෘති පත්‍රයෙන් විධිමත්ව සම්පූර්ණ කර ඉදිරිපත් නොකරන අයදුම්පත් සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බවත් වැඩිදුරටත් දන්වා සිටිමි. ( CSS/7/1/FO1 ආකෘති පත්‍රයේ පිටපත අමුණා ඇත.)

ඩබ්ලිව්.කේ.කේ.අතුකෝරල,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின்-அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம்: / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්.දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.